# 2014

# කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය

**புத்தசாசனம் மற்றும் மத அலுவல்கள் அமைச்சு**

**Ministry of Buddhasasana and Religious Affairs**

# දැක්ම

සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරීමේ ප්‍රමුඛ පහසු කරන්නා බවට පත්වීම.

# මෙහෙවර ප්‍රකාශය

ආගමික මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින්, බුදුදහම ප්‍රමුඛ සියලු ආගමික ඉගැන්වීම් මත පදනම් වෙමින් සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම තුළින් යහපත් ජීවන රටාවක් සහිත ගුණගරුක සමාජයක් බිහිකිරීමට උරදීම.

## බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක

- ආගමික වටිනාකමකින් යුත් පවුල් 25000 ක් සමාජයීය හා ආර්ථික වශයෙන් බලගැන්වීම.
- ආගමික සිද්ධස්ථාන හා පුද්ගලයා අතර පවතින සබඳතාවය තර කර ගැනීම සඳහා ඊට නව හැඩතලයක් ලබාදෙමින් ධනාත්මක ආකල්ප වර්ධනය කරන උසස් පුද්ගල පෞරුෂයක් සහිත දහම් අධ්‍යාපන ජාලයක් ප්‍රතිනිර්මාණය කිරීම.
- සියලු ආගමික මධ්‍යස්ථාන තොරතුරු තාක්ෂණයෙන් බල ගන්වා බහුසේවා සපයන මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.
- ආගමික සිද්ධස්ථාන පද්ධතිය දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කළ හැකි මහජන ප්‍රසාදය දිනූ ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කර ගැනීම.
- සම්ප්‍රදාය සංරක්ෂණය කර නූතන පරපුර වෙත රැගෙන යන ද්වාරයක් ලෙස විධිමත් භෞතිකමය සංවර්ධනයක් සහිත ආගමික මධ්‍යස්ථාන ප්‍රතිනිර්මාණය කිරීම.
- ආගමික සිද්ධස්ථානයන් හට ශක්තිමත් වන පරිදි මනා විනිවිදභාවයකින් යුත් තාක්ෂණයානුකූල විගණන හා විමර්ශන ක්‍රමවේදයක් සහිත භාර හා අරමුදල් ප්‍රතිෂ්ඨාපනය කිරීම.

# පටුන

**මාතෘකාව** **පිටු අංකය**


1 පිවිසුම හා පැතිකඩ 5-6

2 භෞතික සංවර්ධන වැඩසටහන් 7-9

2.1 විහාරස්ථාන සඳහා ආධාර ලබා දීම

2.2 විශේෂ ඉදිකිරීම්

2.2.1 නේපාලයේ ලුම්බිණි විහාරස්ථානය

2.2.2 නේපාලයේ ලුම්බිණි නුවර ස්ථාපිත දුටුගැමුණු විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම

2.2.3 විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම

2.2.4 අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය

2.2.5 මහවැලි මහාසෑය - කොත්මලේ

3 අධ්‍යාත්මක සංවර්ධන වැඩසටහන් 09-13

3.1 පුණ්‍යග්‍රාම වැඩසටහන

3.2 මතට තිත ව්‍යාපෘතිය

3.3 වෙනත් භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

3.4 හින්දු බෞද්ධ සහජීවන වැඩසටහන

3.5 දැහැමි නිවහනයි - අපේකම රැදි හෙට දිනයි වැඩසටහන

4 ආගමික නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 13-15

4.1 ධර්ම සන්නිවේදකයන් වහන්සේලා පුහුණු කිරීමේ ව්‍යාපෘතිය

4.2 සිල්මාතාවන්ගේ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

5 පූජාභූමි සංවර්ධනය 16

6 විශේෂ වැඩසටහන් 17-18

6.1 2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් දහම් පාසල් 2600 ක් සංවර්ධනය කිරීම

6.2 බොදු දිනපොත මුද්‍රණය කිරීම

6.3 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

7 ඇමුණුම් ලේඛනය 19-28

# 1. පිවිසුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මෙරටේ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන අතර, බුද්ධශාසනය ආරක්ෂා කිරීම, පෝෂණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසන්නා සේම සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද අවධාරණය කර ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරලීම පිණිස සුදුසු ව්‍යාපෘතීන් සමාජගත කිරීම හා සියලු ආගම් නියෝජනය කෙරෙන පරිදි සමස්ත ශ්‍රී ලාංකේය සමාජයම ආවරණය වන අයුරින් යහගුණ වර්ධනයෙහි ලා ඉවහල් වන වැඩසටහන් දියත් කිරීම බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ වගකීම බවට පත් ව ඇත. මේ අනුව බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ අතුරින් සුවිශේෂ වූ රාජ්‍ය ආයතනයක් වන්නේ නිරායාසයෙනි.

ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධිත පුරවැසියන් සහිත දේශයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මේ යුගයේ දී වඩාත් තදින් දැනෙන බැවින් ඒ සඳහා කළ යුතු දෑ කල් නොයවා කළ යුතුය.

ඒ අනුව බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, ඒ යටතේ ඇති සෙසු දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශාල කාර්යභාර්යයක් ඉටුකරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් සියල්ලේම දියුණුව පිණිස බලපවත්නා වූ කාර්යයන් මෙන්ම ආගමික සහයෝගීතාවය ඒ ඒ ආගම් නියෝජනය කරන පූජ්‍ය පූජක උතුමන්ගේ ධර්ම පුස්තක, ආගමික දේපල, ඓතිහාසික ආගමික උරුමයන් ආදී සියලුම කාර්යයන්ගේ උන්නතිය ඇති කිරීම වෙනුවෙන් බුද්ධශාසන හා ආගමික කටුයතු අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි.

# පැතිකඩ

ඉන්දියන් සාගරයේ මුතු ඇටය නමින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව, ඉන්දියානු උප මහද්වීපයට දකුණු දෙසින් පිහිටි වර්ග කිලෝමීටර 65,610 ක් පුරා පැතිරුණු දිවයිනකි. ජනගහණය මිලියන 20 ක් පමණ වන අතර, එය ප්‍රධාන වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා අනෙකුත් කුඩා ජන කණ්ඩායම් 23 ක සංයෝගයෙන් නිර්මාණය වී ඇත. ආගමික වශයෙන් බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ලෙස චතුර් වර්ගයක් යටතේ හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතරට අයත් ජනතාවගෙන් 71% ක් බෞද්ධ වන අතර 12% ක් පමණ හින්දු ය. ඉතිරි ජනගහණයෙන් 09% ක් ඉස්ලාම් වන අතර 07% ක් ක්‍රිස්තියානි යන ආගම් අදහති. සෑම පුරවැසියෙකුටම තමා කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබී ඇති අතර, ජනතාවට වඩාත් පහසුවෙන්ම තම අධ්‍යාත්මය පෝෂණය කර ගැනීම සඳහා ඔවුන්ට රුකුළක් ලෙස බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් සෑම ආගමක් සඳහාම භෞතික සංවර්ධනය යටතේ ආගමික ස්ථාන සංවර්ධනය හා සෑම ආගමක්ම කේන්ද්‍ර කොට ගත් සදාචාර වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

බෞද්ධ ආගමික ජනතාව සඳහා බෞද්ධ ආගමික මධ්‍යස්ථාන 11,132 ක් ද, හින්දු ජනතාව සඳහා හින්දු ආගමික මධ්‍යස්ථාන 6,051ක් ද, මුස්ලිම් ජනතාව සඳහා මුස්ලිම් ආගමික මධ්‍යස්ථාන 1,831 ක් ද, ක්‍රිස්තියානි ජනතාව සඳහා ක්‍රිස්තියානි ආගමික මධ්‍යස්ථාන 2,099 ක් ද, ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව ඇත. (වගු අංක 03 බලන්න)

දහම් අධ්‍යාපනය සමස්තයක් ලෙස ගතහොත් 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී වර්ධනයක් පෙන්නුම් කරන අතර දහම් පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් වර්ධනීය අවධියක් පෙන්නුම් කරයි. (වගු අංක 04 බලන්න)

# 2. භෞතික සංවර්ධන වැඩසටහන්

## 2.1 විහාරස්ථාන සඳහා ආධාර ලබාදීම.

සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් වෙත ප්‍රජාව රැගෙන යාමේ ක්‍රියාවලිය පහසු කරවීම සඳහා විහාරස්ථාන සතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ආර්ථික අපහසුතා ඇති දුෂ්කර විහාරස්ථාන භෞතිකව සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කරනු ලබයි. 2014 වර්ෂය සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 14.2 ක් වන අතර 2014.12.31 දිනට සමස්ත විහාරස්ථානවලට ලබාදුන් ආධාර මුදල රුපියල් මිලියන 14.2 ක් වන අතර විහාරස්ථාන සංඛ්‍යාව 142 කි. (වගු අංක 05 බලන්න)

## 2.2 විශේෂ ඉදිකිරීම්

### 2.2.1 නේපාලයේ ලුම්බිණි විහාරස්ථානය

නේපාලයේ ලුම්බිණි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලුම්බිණි සල් උයන අවටින් සියලු බෞද්ධ රටවල් සඳහා එම රටවලට ආවේණික බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීමට ඉඩකඩ ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාවය පිළිබිඹු වන ආකාරයේ විහාරස්ථානයක් ඉදිකිරීම පිණිසත්, දඹදිව වන්දනා සඳහා යන ශ්‍රී ලාංකේය සහ වෙනත් විදේශීය බැතිමතුන්ට වන්දනා කර ගැනීමටත්, ජගත් බොදු ප්‍රජාවගේ නොමද ගෞරවාදරයට පාත්‍රවන ඓතිහාසික ලුම්බිණියේ පෙර පැවති බෞද්ධ ප්‍රබෝධය ඉස්මතු කොට නැවත ප්‍රබෝධමත් කිරීමේ සත්කාර්යය ඉටු කිරීම පිණිසත් මෙම විහාරස්ථානය ඉදිකර ඇත.

මේ වන විට විහාර සංකීර්ණයට අයත් දිය අගල, ප්‍රවේශ මාර්ගය, මකර තොරණ, සඳකඩ පහන, අටවිසි බුද්ධ ප්‍රතිමා සහිත බෝධිඝරය, රන්වැට, තුන්මහල් ගොඩනැගිල්ල, මල් ආසන, වළාකුළු බැම්ම, සම්මන්ත්‍රණ ශාලාව, පුස්තකාලය, විහාරයේ බිතුසිතුවම් හා චෛත්‍යය ඉදි කර ඇත.

විහාරස්ථානයේ පිවිසුම් මාර්ගයේ පාලමක් ඉදි කර ඇති අතර එහි කටයුතු අවසන් කිරීම සඳහා 2014 වර්ෂයේ දී රුපියල් මිලියන 5.0 ක් වැයකරන ලදි.

### 2.2.2 නේපාලයේ ලුම්බිණි නුවර ස්ථාපිත දුටුගැමුණු විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.

නේපාලයේ ලුම්බිණි පූජාභූමිය වන්දනා කිරීමට යන ශ්‍රී ලාංකික බැතිමතුන්ගේ ප්‍රයෝජනය සඳහා "දුටුගැමුණු විශ්‍රාම ශාලාව" නමින් විශ්‍රාම ශාලාවක් 1992 වර්ෂයේ දී ස්ථාපිත කර ඇත. නේපාලයේ ලුම්බිණි සංවර්ධන භාරය විසින් ලුම්බිණි සංවර්ධන සැලැස්මෙන් ලබා දුන් ඉඩමෙහි, මෙම විශ්‍රාම ශාලාව ඉදිකර ඇත.

මෙම විශ්‍රාම ශාලාව නේවාසික කාමර 31 කින්, සේවා කාමර 06 කින්, ධර්ම සම්මන්ත්‍රණ ශාලා 03 කින්, මුළුතැන්ගෙයකින් සහ සේවක නිවාස වලින් යුක්ත වේ. 2014.11.25 වන දින මෙම විශ්‍රාම ශාලාව විවෘත කළ අතර ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 138.0 ක් වැයකරන ලදි.

### 2.2.3 විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම

දෙස් විදෙස් භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිසට බෞද්ධ දර්ශනය පිළිබඳව අදහස් උදහස් හුවමාරු කර ගැනීමට අන්තර් ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක අවශ්‍යතාවය සපුරනු වස්, ශ්‍රවනාගාර, රැස්වීම් ශාලා, භෝජනාගාර, ප්‍රදර්ශන ශාලා හා උත්සව ශාලාවකින් යුත් අති නවීන සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් පරිශ්‍රයේ මෙම ගොඩනැගිල්ල ඉදිකරමින් පවතී.

2013 වර්ෂයේ දී මෙම ගොඩනැගිල්ලේ V වන අදියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර 2014 වර්ෂය වන විට මේ සඳහා ගෙවා ඇති මුදල රුපියල් මිලියන 119 කි.

### 2.2.4 අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය

විවිධ රාජකාරී කටයුතු සඳහා සහ අනුරාධපුර ඓතිහාසික පූජාභූමිය වන්දනා කිරීමට පැමිණෙන රාජ්‍ය නිලධාරීන්ට සහනදායී මිලට නවාතැන් පහසුකම් ලබාදීමේ අරමුණින් අනුරාධපුර මිහින්තලය ප්‍රධාන පාරේ කුරුන්දන්කුලම ප්‍රදේශයේ කාමර නවයකින් හා දේශන ශාලාවකින් සමන්විත දෙමහල් විශ්‍රාම ශාලාවක් ඉදිකර ඇත. 2014 වර්ෂයේ දී පුද්ගලයින් 1334ක ප්‍රමාණයකට මෙහි නවාතැන් පහසුකම් ලබා දී ඇති අතර එමගින් ලැබූ ආදායම රුපියල් 449,718.78කි.(වගු අංක 06 බලන්න)

### 2.2.5 මහවැලි මහා සෑය - කොත්මලේ

මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ දී ඉවත් කිරීමට සිදු වූ බෞද්ධ විහාරස්ථාන 21 ක් වෙනුවට රුවන්වැලි මහා සෑයට පමණක් අඩි දෙකකින් උසින් අඩු කොත්මලේ මහවැලි මහා සෑය නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉදි කිරීමේ ව්‍යාපෘතිය 1983.03.20 හිටපු මහවැලි සංවර්ධන අමාත්‍ය දිවංගත ගරු ගාමිණී දිසානායක මැතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ වී ඇත. දැනට ඉදිවෙමින් පවතින මෙහි හතරැස් කොටුවේ සිට කොත් කැරැල්ල දක්වා ඉදිකිරීම් කටයුතු මහවැලි සංස්කෘතික පදනම් භාරය විසින් බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි.

2014 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 23.0 ක් වැය කර ඇත.

# 03. ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

## 3.1 පුණ්‍යග්‍රාම වැඩසටහන

3.1.1 අරමුණු

1. විහාරස්ථානය හා ගම අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම.
2. අපරාධ කෙරෙහි වූ භීතිකාවකින් තොරව වඩාත් සුරක්ෂිත පරිසරයක ජීවත් වීම සඳහා ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් ගම තුළ ස්ථාපිත කිරීම.
3. සාරධර්ම අගයන මානව හිතකාමී සමාජයක් ස්ථාපනය කිරීම.
4. විහාරස්ථානයේ මූලික විහාරංගනයක් ඉදිකිරීම.
5. විහාරස්ථානය කේන්ද්‍ර කොට ගත් ග්‍රාමීය දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

3.1.2 ක්‍රියාත්මක ක්‍රමවේදය

මෙම වැඩසටහන අදාළ දිස්ත්‍රික්කවල පොලිස් බල ප්‍රදේශ මට්ටමින් තෝරා ගනු ලැබූ දුෂ්කර ආගමික සිද්ධස්ථාන හා එකී ගම්මාන ද සංවර්ධනය කරමින් ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලැබේ. එහිදී ග්‍රාමීය මට්ටමින් ස්වෙච්ඡා ක්‍රියාකාරීන් 10 දෙනා බැගින් තෝරා එහි පුහුණුව ලබා දී ඔවුන් මඟින් ව්‍යාපෘති ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා කටයුතු කරනු ලබයි.

පොලිස් ස්ථානවල ප්‍රජා පොලිස් ස්ථානාධිපති මඟින් ව්‍යාපෘති මෙහෙයුම් ක්‍රියාවලිය බල ගැන්වෙන අතර පොලිස් ස්ථානාධිපති, සහකාර පොලිස් අධිකාරී, නියෝජ්‍ය පොලිස්පති යන අය මඟින් ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම කරනු ලබයි.

මෙම වැඩසටහන ගම්මාන 73 ක ක්‍රියාත්මක කරනු ලබන අතර සමස්ත ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. (වගු අංක 07 බලන්න)

### 3.1.3 මූල්‍යමය ආධාර ස්වභාවය

ආධාර ලබාදීමේ දී ප්‍රධාන විහාරස්ථානයක් සඳහා රුපියල් 125,000.00 ක ආධාර මුදලක් ලබා දීම සිදු කරනු ලබයි.

### 3.1.4 වියදම් ස්වභාවය

පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 2.94 ක් ද ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 19.55 ක් ද වශයෙන් රුපියල් මිලියන 22.49ක් 2014 වර්ෂය තුළ වියදම් දරන ලදි. (වගු අංක 08 බලන්න)

## 3.2 මතට තිත ව්‍යාපෘතිය

### 3.2.1 පසුබිම

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය "මතින් තොර සමාජයක් බිහිකිරීම" සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2007 වර්ෂයේ දී බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිතව ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් ඒකකය ස්ථාපිත කළ අතර එතැන් සිට වර්තමානය දක්වාම අඛණ්ඩව මෙම වැඩසටහන ක්රියාත්මක වේ.

### 3.2.2 අරමුණ

මතට තිත ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩපිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කරමින් ජනතාවට මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන හානිය අවම කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ජනතාව තුළ ඇති හැකියාව වැඩි දියුණු කරමින්, සංවර්ධිත රටක් තුල සාරධර්ම සුරකින සතුටින් පිරි ජනතාවක් සහිත දේශයක් ගොඩනගා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

3.2.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතය ක්‍රමානුකූලව අඩුකිරීම, ඒවා භාවිතයෙන් සිදුවන හානිය අවම කිරීම හා නීති විරෝධී මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන් තුරන් කිරීම මඟින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම දියුණු කිරීමත්, නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීමත්, දිළිඳුකම පිටු දැකීම සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන ඍජු හා වක්‍ර හානිය පිළිබඳව නිවැරදිව ජනතාව දැනුවත් කිරීම මෙමගින් කරනු ලබයි.

3.2.4 වියදම් ස්වභාවය

2014 වර්ෂයට රුපියල් මිලියන 11.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර, ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. (වගු අංක 09 බලන්න).

## 3.3 වෙනත් භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

3.3.1 හැඳින්වීම

බුදු දහමේ දිගු කාලීන චිරස්ථිථිය සහ පැවැත්ම සඳහා වර්තමාන සමාජය තුළ විවිධ භාෂාවන් පිළිබඳ භික්ෂූන් වහන්සේලා සතු දැනුම, අවබෝධය හා ප්‍රායෝගික භාවිතය ඉතා වැදගත් වේ. ඒ වෙනුවෙන් මෙරට වාසය කරන බෞද්ධ, හින්දු මෙන්ම ලොව බුදුදහම පවතින රටවල්වල ජනතාව වෙනුවෙන් ධර්ම ඥානය පැතිරවීම සඳහා දෙමළ, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත භාෂා ඉගැන්වීමටත් භික්ෂූන් වහන්සේලා සතු භාෂා ඥානය පුළුල් කිරීම සඳහාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

3.3.2 අරමුණ

භික්ෂූන් වහන්සේලාට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා භාෂා හැකියාවන් වර්ධනය කිරීම හා විධිමත් භාෂා ඥානයක් ලබා දීම.

3.3.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලය, අගලවත්ත ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය, කෑගල්ල සංඝ අධ්‍යාපන මණ්ඩපය යන මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙය නේවාසික පුහුණු වැඩසටහනක් වේ.

3.3.4 වියදම් ස්වභාවය

2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.5 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, 2014.12.31 දිනට වියදම රුපියල් 355,434.00 කි.

## 3.4 හින්දු බෞද්ධ ආගමික සහජීවන වැඩසටහන

### 3.4.1 හැඳින්වීම

තිස් වසරක් පුරා මෙරට පැවති කුරිරු යුද්ධය නිම කිරීමෙන් පසු සිංහල, දෙමළ ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය, සුහදතාවය වර්ධනය කිරීම මෙරට සාමකාමී වාතාවරණයක් සහිත රටක් වශයෙන් පවත්වා ගැනීමට බෙහෙවින් වැදගත් වනු ඇත. හින්දු බෞද්ධ සහයෝගිතා වැඩසටහන ඒ සඳහා දිගුකාලීන පියවරක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතරින් එකකි. හින්දු සහ බෞද්ධ ප්‍රජාව අතර සහයෝගිතාවය වර්ධනය කිරීමේ ක්‍රමෝපායක් ලෙසින් හින්දු බෞද්ධ දහම් පාසල් දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. හින්දු බෞද්ධ දහම් පාසල් දරුවන් තුළ ඒ ඒ ආගමික සංස්කෘතීන් හඳුනා ගැනීම, අන්‍යෝන්‍ය ගෞරවය සුරැකීම තුළින් සහයෝගීතාවයෙන් කටයුතු කළ හැකි අනාගත පරපුරක් බිහි කිරීමේ මූලික පියවර සකස් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාවට නංවනු ඇත.

### 3.4.2 අරමුණ

සිංහල හා ද්‍රවිඩ ප්‍රජාව තුළ සහයෝගීතාවය වර්ධනය කිරීමේ ක්‍රමෝපායක් ලෙස බෞද්ධ හා හින්දු ආගම් මඟින් කියැවෙන ආධ්‍යාත්මික හරයන් යොදා ගැනීම "මල්බර වසන්තය" නම් වූ මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

### 3.4.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

එක් වැඩසටහනක් මැදිරිගිරිය හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන පවත්වන ලදි. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පවත්වනු ලබයි.

### 3.4.4 වියදම් ස්වභාවය

2014 වර්ෂය සඳහා වෙන් වූ ඇස්තමේන්තුව රුපියල් මිලියන 2.395 කි. 2014.12.31 දින වන විට මුළු මුදලම වැය වී ඇත.

## 3.5 දැහැමි නිවහනයි අපේකම රැඳි හෙට දිනයි වැඩසටහන

### 3.5.1 හැඳින්වීම

ප්‍රජා පාදක සංවර්ධන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන මෙය, ප්‍රජාව අරමුණු කරගත් ඔවුන්ගේ සම සහභාගීත්වයෙන් කුටුම්භ සමාජ තත්ත්වය නඟා සිටුවීමෙහි ලා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

3.5.2 අරමුණු

- පවුල තුලින් සිය දෛනික පරිභෝජනය සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යයන් නිෂ්පාදනය කර ගැනීම.
- සමාජයීය / සංස්කෘතිකමය වශයෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් යුතු පවුල යන්න ප්‍රතිනිර්මාණය කිරීම.
- සෑම ආගමකම උගන්වනු ලබන ආගමික හා සමාජයීය හර පද්ධතීන් පවුල හරහා සමාජය වෙත ලබා දීම.
- ප්‍රජා මූල සංවිධානයන් හි පුද්ගල ක්‍රියාකාරීත්වය සක්‍රීය මට්ටමකට ගෙන ඒම සහ සිය ප්‍රදේශයේ අවශ්‍යතා අනුව ක්‍රියාත්මක කරවීමට හුරු කරවීම.
- මත්ද්‍රව්‍ය සඳහා තරුණ පිරිස යොමු වීමේ ප්‍රමාණය අවම කිරීම සඳහා දැනට මත්ද්‍රව්‍ය භාවිතා කරන්නවුන් ඒ සඳහා ඇබ්බැහි වීමේ මට්ටම වලක්වා ගැනීම.
- අවම මුදලක් බෝවන රෝග සඳහා වැය කරනු ලබන කුටුම්භයක් බිහිකිරීම.
- සිය ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයන්ගේ රැකවරණය සහ පැවැත්ම සඳහා සක්‍රීය ලෙස පෙනී සිටින පුද්ගලයෙක් සිටීම.
- කුටුම්භ ඉතුරුම් වර්ධනය කිරීම.
- ත්‍රෛභාෂා ලිවීමට සහ කියවීමට දන්නා පුද්ගලයෙක් බිහිකිරීම.
- වෘක්ෂලතා රැක ගැනීම සඳහා සක්‍රීය දායකත්වයක් ඇති පුද්ගලයෙක් බිහි කිරීම.

3.5.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

ප්‍රාදේශීය ලේකම් සහ පූජ්‍ය පක්ෂය හරහා සිදු කරනු ලබයි.

3.5.4 වියදම් ස්වභාවය

2014 වර්ෂය සඳහා අනුමත ඇස්තමේන්තුව රුපියල් මිලියන 40.0 කි. 2014.12.31 දිනට වියදම ද රුපියල් මිලියන 40.0 කි.

# 04. ආගමික නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන

## 4.1 ධර්ම සන්නිවේදකයින් වහන්සේලා පුහුණු කිරීමේ ව්‍යාපෘතිය

4.1.1 පසුබිම

පන්සල සහ භික්ෂූන් වහන්සේ මූලික කර ගනිමින් ගොඩ නැගුණු ශ්‍රී ලාංකික ජන සංස්කෘතිය තුළ බෞද්ධ භික්ෂූන් වහන්සේට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මේ අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ශාස්ත්‍රීය

දැන උගත්කම, සමාජ සම්බන්ධතා මනා ලෙස පවත්වා ගැනීම කෙරෙහි දක්වන කුසලතාව මෙන් ම ගිහි සමාජය අපේක්ෂා කරනු ලබන චාරිත්‍ර ඉටු කිරීමේ දී උන්වහන්සේ දක්වන පරිනත භාවය ආදී කරුණු ශ්‍රී ලාංකේය සමාජයේ යහපැවැත්ම කෙරෙහි ඍජුවම බලපානු ඇත. මෙම වැඩසටහන ගම හා පන්සල අතර සබඳතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් හා නායකත්ව ගුණයෙන් පිරිපුන් භික්ෂු පරපුරක් ගොඩනැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

### 4.1.2 අරමුණු

- භික්ෂූන් වහන්සේගේ ධර්ම ඥානය වැඩිදියුණු කිරීම පිණිස උපකාරී වීම.
- භික්ෂූන් වහන්සේගේ සහ සාමාන්‍ය ගිහි ජනතාව අතර පවතින සබඳතාවය වඩා හොඳ මට්ටමකට ගෙන ඒම පිණිස ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම.
- ගම හා පන්සල අතර පවතින සබඳතාවය තව දුරටත් නොනැසී පවත්වාගෙන යාම සහ එම සබඳතාවය වඩා දියුණු මට්ටමකට පත් කිරීම පිණිස අලුතින් සසුන්ගත වන භික්ෂූන් වහන්සේ දැනුමින් පෝෂණය කිරීම.
- සෑම සමාජ කාර්යයකදීම විහාරස්ථානය මුල් තැන ගත හැකි පරිදි නායකත්ව ගුණයෙන් පිරිපුන් භික්ෂු පරපුරක් බිහිකිරීමට උරදීම.
- විහාරාරාම පරිපාලනය කිරීමේ දැනුම ඉහළ තලයකට නැංවීම තුළින් ශාසනික චිරස්ත්ථිය ඇති කිරීම.

### 4.1.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

දිස්ත්‍රික්ක 12 ක් කේන්ද්‍ර කරගනිමින් විහාරස්ථාන 125 ක භික්ෂූන් වහන්සේලා 500 ක් සහභාගී කර ගනිමින් වැඩසටහන් 12 ක් 2014 වර්ෂයේ දී පවත්වන ලදි. මෙයට අමතරව අදියර I වැඩසටහනට සහභාගී වූ ධර්ම සන්නිවේදකයින් වහන්සේලාගෙන් තෝරා ගත් ස්වාමීන් වහන්සේලා 10 නමක් සහභාගී කරගෙන අනුරාධපුර හා මහනුවර දිස්ත්‍රික්කයන් හි විහාරස්ථාන 20 ක් කේන්ද්‍ර කොට ගෙන ධර්ම දේශනා වැඩසටහන් පවත්වන ලදි.

### 4.1.4 වියදම් ස්වභාවය

2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.0 ක ප්‍රතිපාදන ලැබුණු අතර 2014.12.31 දිනට වියදම ද රුපියල් මිලියන 3.0 කි.

## 4.2 සිල් මාතාවන්ගේ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

### 4.2.1 පසුබිම

බුද්ධශාසන ජනාධිපති කොමිසන් සභා වාර්තාවේ (2002) සඳහන් 7 වන පරිච්ඡේදයේ 7-18 ඡේදයේ සඳහන් පරිදි දසසිල් මාතාවන්ගේ අධ්‍යාපනය නංවාලීම උදෙසා නේවාසික පහසුකම් ඇති සියලු පහසුකම් සහිත අධ්‍යාපන ආයතන රට පුරා පිහිටුවිය යුතු බවට නිරිදේශ කර ඇත. එසේම මෙම අධ්‍යාපන ආයතනවල අනිවාර්යයෙන්ම පාලි, සිංහල, ත්‍රිපිටක බුද්ධ ධර්මය ඉගැන්විය යුතුය. ප්‍රයෝගික අධ්‍යාපනය ලෙස උපාසිකාරාම පාලනය, වත් පිලිවෙත්, ධර්ම සාකච්ඡා මෙහෙය වීම, පිරිත් සජ්ජායනා ආදී විෂයයන් ඉගැන්විය යුතුය. පවුල් උපදේශනය, ගිලානෝපස්ථානය, ප්‍රජා සේවය, ළදරු පාසල් පවත්වාගෙන යාම ආදී විෂයන් පිළිබඳ පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුය. මෙවන් වූ සේවාවක් ඉටුකර ගැනීම පිණිස ඵලදායී ලෙස යොදවා ගත හැකි සිල් මාතාවන් හට එම සත් කාර්යය ඉටු කිරීමේ දී උන්වහන්සේලා සතු දැනුම, සමාජ දක්ෂතා සහ කුසලතා හඳුනාගැනීමටත්, වර්ධනය කර ගැනීමටත් අවස්ථාව උදා කර දීම සදාචාර සම්පන්න දේශයක් නිර්මාණය කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කරන්නා වූ රජයක වගකීම වන්නේය. ඉහත නිර්දේශයන් පදනම් කරගෙන සිල්මාතා වැඩසටහන මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවනු ලැබේ.

### 4.2.2. මූලික අරමුණු

- සිල්මාතාවන්ගෙන් ඉටුවන ශාසනික, සමාජීය හා ශාස්ත්‍රීය සේවාවන් ඉහළ තලයට පත් කිරීම.
- සිල්මාතාවන්ගේ ආගමික හා ශාස්ත්‍රීය ඥානය ඉහළ නැංවීම පිණිස ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙලක් සකස් කිරීම.
- සිල්මාතාව ආගමික හා සමාජයීය සේවාවන් (පවුල් උපදේශනය, ගිලානෝපස්ථානය, ළදරු පාසල්) ඉටු කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යයභාරයක් ඉටුකරන පිරිසක් බවට පත් කිරීම.
- සිල්මාතාවන්ගේ ධර්ම ඥානය හා හෙළ බෞද්ධ සංස්කෘතිකාංග පිළිබඳ දැනුම ඉහළ නැංවීම.
- සිල්මාතා ආරාමවල පවතින භෞතික සම්පත් දියුණු කිරීම.

### 4.2.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය යොදා ගැනීම මඟින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

### 4.2.4 වියදම් ස්වභාවය

2014 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 1.734 ක් වැය කර ඇත. (වගු අංක 10 බලන්න)

## 05. පූජා භූමි සංවර්ධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010 නොවැම්බර් 22 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පූජා භූමි සැලසුම්කරණය හා සංවර්ධනය කිරීම යන කර්තව්‍යයන් බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතට පැවරී ඇත. කිසියම් විහාරස්ථානයක් හෝ පල්ලියක් හෝ කෝවිලක් හෝ දේවාලයක් හෝ පූජා භූමියක් ලෙස හඳුනා ගෙන නම් කොට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම අමාත්‍යාංශයේ කාර්යභාරය වේ. මෙහිලා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ද සහය කරගනු ලැබේ. වර්ෂ 1946 අංක 13 දරණ (20 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ 6(2) (ආ) හා 21(2) (ආ) වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන භූමිභාග පූජා භූමි ලෙස හඳුන්වනු ලැබේ.

මෙහිලා පහත සඳහන් නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

- ජාතික මට්ටමෙන් විශේෂ වූ ද වැදගත් වූ ද පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස අනුරාධපුරය, තිස්සමහාරාමය, මහියංගනය, කැළණිය, දඹුල්ල, තලවිල පල්ලිය හා තිරුක්තීෂ්වරම් කෝවිල ආදී පූජනීය ස්ථාන දැක්විය හැක.)
- ප්‍රාදේශීය මට්ටමින් වැදගත් වූ පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස ඇත්කඳ විහාරය, සමන් දේවාලය (රත්නපුර), බෙල්ලන්විල, තේවත්ත පල්ලිය හා මුන්නේෂ්වරම් ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය.)
- පුරාවිද්‍යාත්මක සාධක සහිත ඓතිහාසික වටිනාකමැති පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුනක් ලෙස මාළිගාවිල, දෙල්ගමුව රජමහා විහාරය, රිදී විහාරය, නැදිගම්විල, දීඝවාපිය ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය.)
- ප්‍රාදේශීය වශයෙන් ඒ ඒ පූජනීය ස්ථානයන් මඟින් සිදුකරනු ලබන සුවිශේෂ වූ ආගමික හා සමාජයීය සේවාවන් පදනම් කරගෙන විෂය භාර අමාත්‍යතුමා විසින් හඳුනා ගනු ලබන පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස රංවල පහන දේවාලය (පුවක්පිටිය), සිරි වජිරාරාමය( බම්බලපිටිය), ශ්‍රී අභයාරාමය (නාරාහේන්පිට), පොකුණුවිට රජමහා විහාරය (හොරණ)ආදි පූජනීය ස්ථාන දැක්විය හැකිය.

ඒ අනුව ආගමික වැදගත්කම, ඓතිහාසික වැදගත්කම, පුරාවිද්‍යාත්මක වැදගත්කම, සංස්කෘතික වැදගත්තම, ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම, පාරිසරික වැදගත්කම, ආර්ථික හා සමාජයීය වැදගත්කම යන කරුණු ද සැලකිල්ලට ගනිමින් පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර සපයනු ලැබේ. 2014 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන රුපියල් මිලියන 120.0 ක් වන අතර 2014.12.31 දින වන විට මුළු මුදලම වැය කර ඇත.

## 06. විශේෂ වැඩසටහන්

### 6.1 2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් දහම් පාසල් 2600 ක් සංවර්ධනය කිරීම

දෙදහස් හයසීය වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් අවම පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන දහම් පාසල් ප්‍රතිසංවිධානය කිරීම කරනු ලබයි. ඒ අනුව 2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 88.00 ක් ප්‍රතිපාදන වෙන් වූ අතර එයින් 2014.12.31 වන දිනට රුපියල් මිලියන 86.35 ක් සංවර්ධන කටයුතු සඳහා වැය කර ඇත. (වගු අංක 11 බලන්න)

### 6.2 බොදු දිනපොත මුද්‍රණය කිරීම හා බෙදා හැරීම.

විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ භාවිතය සඳහා මෙම දිනපොත මුද්‍රණය කර බෙදා හරිනු ලැබේ. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ත්‍රෛනිකායේ තොරතුරු හා ඊට අනුබද්ධ සෙසු නිකාය පාර්ශ්වවල තොරතුරු මෙන්ම සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තොරතුරු ආදී ස්වාමීන් වහන්සේලාට වැදගත් වන තොරතුරු ඇතුලත් කොට මෙම දිනපොත සකසා ඇත.
විහාරස්ථාන දිනපොතට සමගාමීව ඇමතුම් දිනපොත ද භික්ෂූන් වහන්සේලාට විශේෂිත අයුරින් සකස් කර මුද්‍රණය කරනු ලැබේ. (වගු අංක 12 බලන්න)

### 6.3 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

6.3.1 පසුබිම

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ආගමික සිද්ධස්ථාන වැඩිදියුණු කිරීම හා ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම කරනු ලබයි.

6.3.2 අරමුණ

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව ගොඩනංවන භෞතික සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵල නිසියාකාරව භුක්ති විඳීම සඳහා ආධ්‍යාත්මික වශයෙන් දියුණු යහපත් සමාජයක් ගොඩනැගීම මෙහි අරමුණයි.

6.3.3 ක්‍රියාත්මක ක්‍රමවේදය

දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රතිපාදන ලබා දෙමින් ප්‍රාදේශීය ලේකම්ගේ ඍජු අධීක්ෂණය යටතේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍යාධාර ලබාදීම සිදු කරනු ලබයි.

6.3.4 වියදම් ස්වභාවය

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ආධාර ලබාදීමේ දී 2014 වර්ෂය සඳහා රු. මිලියන 50.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර 2014.12.31 දිනට විහාරස්ථාන සංවර්ධනය සඳහා රු. මිලියන 35.0 ක් ද දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සැකසීම සඳහා රු. මිලියන 15.0 ක් ද වියදම් වී ඇත.(වගු අංක 13 බලන්න)

## 07. ඇමුණුම් ලේඛණය

### වගු අංක 01

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2014.12.31 දිනට කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | අදාළ සේවය | ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 02 | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 03 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 04 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I | 04 | 03 (වැ.බ.1) | 01 |
| 05 | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | I | 01 | - | 01 |
| 06 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | 01 | 01 | - |
| 07 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I I I | 04 | 02 | 02 |
| 08 | නි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I I/ I I I | 01 | 01 | - |
| 09 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I I I, I I/ I | 01 | 01 (වැ.බ.) | - |
| 10 | ගණකාධිකාරී (ප්‍රධාන අභ්‍යන්තර විගණක) | ශ්‍රී.ලං.ග.සේ. | | 01 | 01 | - |
| 11 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | අධිපන්තිය | 01 | 01 (වැ.බ.) | - |
| 12 | භාෂා පරිවර්තක | භා.ප.සේ | I | 01 | - | 01 |
| 13 | ලේකම්තුමන්ගේ සම්.ලේකම් | තාවකාලික | | 01 | 01 | - |
| 14 | අයවැය සහකාර | ආශ්‍රිත සේවය | | 01 | - | 01 |
| 15 | තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවය | | 03 | 03 | - |
| 16 | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | | 12 | 11 | 01 |
| 17 | සැලසුම් සහකාර | ආශ්‍රිත සේවය | | 01 | - | 01 |
| 18 | සංවර්ධන නිලධාරී | ඒකාබද්ධ සේ. | | 90 | 39 | 51 |
| 19 | තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තා.සේ. | | 01 | - | 01 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස.සේ. | I, I I, I I I | 31 | 21 | 10 |
| 21 | පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුගත | | - | 01 | 01 |
| 22 | කැමරා ක්‍රියාකරු | තාවකාලික | | 01 | - | 01 |
| 23 | කැමරා වීඩියෝ ක්‍රියාකරු | තාවකාලික | | 01 | - | 01 |
| 24 | රියදුරු | ඒ.රි.සේ. | | 17 | 12 | 05 |
| 25 | කැමරා ක්‍රියාකරු සහකාර | තාවකාලික | | 01 | 01 | - |
| 26 | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ. | | 16 | 14 | 02 |
| කුරුන්දන්කුලම විශ්‍රාම ශාලාව | | | | | | |
| 27 | ස්ථාන භාරකරු | රා.කළ.ස.සේ. | I | 01 | - | 01 |
| 28 | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | | 01 | 01 | - |
| 29 | කම්කරු | දෙපාර්තමේන්තුගත | | 01 | - | 01 |
| 30 | සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තුගත | | 01 | - | 01 |
| එකතුව | | | | **198** | **117** | **83** |

## වගු අංක 02

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන සටහන

## වගු අංක 03

ශ්‍රී ලංකාවේ ආගමික මධ්‍යස්ථාන සහ පූජ්‍ය / පූජක සංඛ්‍යාව

| අනු අංකය | ආගම | ආගමික මධ්‍යස්ථාන සංඛ්‍යාව | | ස්වාමීන් වහන්සේ / පූජකවරුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2013 | 2014 |
| 01 | බෞද්ධ | 10,920 | 11,132 | 37,691 | 37,691 |
| 02 | හින්දු | 5,766 | 6,051 | 1,196 | 1,196 |
| 03 | මුස්ලිම් | 2,081 | 1,898 | 4,513 | 4,513 |
| 04 | ක්‍රිස්තියානි | 1,356 | 2,099 | 935 | 2132 |
| එකතුව | | **20,123** | **21,180** | **44,335** | **45,532** |

## වගු අංක 04

ශ්‍රී ලංකාවේ එක් එක් ආගම නියෝජනය කරන දහම් පාසල්, සිසුන්, ගුරුවරුන් සංඛ්‍යාව

| අනු අංකය | ආගම | දහම් පාසල් සංඛ්‍යාව | | සිසුන් සංඛ්‍යාව | | ගුරුවරුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| 01 | බෞද්ධ | 10,340 | 10,431 | 1,968,093 | 2,047,854 | 122,084 | 124,499 |
| 02 | හින්දු | 1,714 | 1,887 | 158,453 | 285,067 | 7,486 | 9,407 |
| 03 | මුස්ලිම් | 555 | 565 | 76,000 | 96,000 | 4,146 | 4,659 |
| 04 | ක්‍රිස්තියානි | 3,429 | 1,350 | 199,910 | 199,082 | 11,280 | 15,151 |
| එකතුව | | **16,038** | **14,233** | **2,402,456** | **2,628,003** | **144,996** | **153,716** |

වගු අංක **05**

2014 වර්ෂයේ දී දුෂ්කර විහාරස්ථාන සඳහා ආධාර ලබා දීම.

| **අනු අංකය** | **දිස්ත්‍රික්කය** | **විහාරස්ථාන සංඛ්‍යාව** | **ලබා දුන් ආධාර මුදල** |
|---|---|---|---|
| 01 | කොළඹ | 08 | 0.95 |
| 02 | ගම්පහ | 05 | 0.80 |
| 03 | කළුතර | 04 | 0.50 |
| 04 | මහනුවර | 08 | 1.10 |
| 05 | මාතලේ | 02 | 0.30 |
| 06 | නුවරඑළිය | 01 | 0.50 |
| 07 | ගාල්ල | 03 | 0.60 |
| 09 | හම්බන්තොට | 01 | 0.25 |
| 11 | ත්‍රිකුණාමලය | 01 | 0.20 |
| 12 | කුරුණෑගල | 05 | 1.00 |
| 13 | පුත්තලම | 18 | 2.15 |
| 14 | අනුරාධපුරය | 03 | 0.15 |
| 15 | පොළොන්නරුව | 04 | 1.05 |
| 16 | බදුල්ල | 01 | 0.30 |
| 18 | රත්නපුරය | 01 | 0.05 |
| 19 | කෑගල්ල | 77 | 4.30 |
| **එකතුව** | | **142** | **14.2** |

වගු අංක 06

2014.12.31 දිනට රජරට චාරිකා විශ්‍රාම ශාලාවෙන් උපයා ඇති ආදායම

| අනු අංකය | මාසය | ආදායම (රු.) | වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ජනවාරි | 35,750.00 | 29,624.37 | 88 |
| 02 | පෙබරවාරි | 37,310.00 | 26,450.87 | 102 |
| 03 | මාර්තු | 28,550.00 | 60,807.56 | 110 |
| 04 | අප්‍රේල් | 17,080.00 | 23,537.98 | 56 |
| 05 | මැයි | 35,490.00 | 35,179.47 | 106 |
| 06 | ජුනි | 66,120.00 | 71,906.48 | 261 |
| 07 | ජූලි | 66,540.00 | 32,112.56 | 116 |
| 08 | අගෝස්තු | 74,490.00 | 41,244.77 | 189 |
| 09 | සැප්තැම්බර් | 42,460.00 | 34,458.17 | 118 |
| 10 | ඔක්තෝබර් | 73,860.00 | 34,611.19 | 54 |
| 11 | නොවැම්බර් | 13,380.00 | 35,213.10 | 73 |
| 12 | දෙසැම්බර් | 39,140.00 | 24,572.26 | 61 |
| එකතුව | | **530,170.00** | **449,718.78** | **1334** |

## වගු අංක 07

**පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ ගම්මාන 73 ක් සංවර්ධනය කිරීම.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පොලිස් ස්ථානය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විහාරස්ථානය |
|---|---|---|---|---|
| 1 | හම්බන්තොට | තංගල්ල | තංගල්ල | බෝධිරුක්කාරාමය |
| 2 | හම්බන්තොට | කටුවන | කටුවන | ශ්‍රී පන්තාරාමය |
| 3 | හම්බන්තොට | මිද්දෙණිය | අගුණකොලපැලැස්ස | සූරිය පොකුණ රජමහ විහාරය |
| 4 | හම්බන්තොට | අගුණකොලපැලැස්ස | අගුණකොලපැලැස්ස | වෙලගත්වල පුරාණ රජමහ විහාරය |
| 5 | හම්බන්තොට | හුංගම | තංගල්ල | පන්තාරාම විහාරය තලුන්න |
| 6 | හම්බන්තොට | බෙලිඅත්ත | බෙලිඅත්ත | ශ්‍රී විජයාරාමය |
| 7 | හම්බන්තොට | වලස්මුල්ල | ඕකේවල | ශ්‍රී ජයතිලකාරාමය |
| 8 | හම්බන්තොට | අම්බලන්තොට | සූරියවැව | හබරත්තවෙල පුරාණ රජමහ විහාරය |

| | | | | |
|---|---|---|---|---|
| 9 | හම්බන්තොට | සූරියවැව | සූරියවැව | ශ්‍රී ධම්ම විජයාරාම විහාරස්ථානය |
| 10 | හම්බන්තොට | වීරකැටිය | වීරකැටිය | පිල්ලේවල පුරාණ විහාරය |
| 11 | හම්බන්තොට | ලුණුගම්වෙහෙර | ලුණුගම්වෙහෙර | ශ්‍රී රතනසාර බෞද්ධ මධ්‍යස්ථානය |
| 12 | හම්බන්තොට | හම්බන්තොට | හම්බන්තොට | ශ්‍රී විසුද්ධාරාමය |
| 13 | හම්බන්තොට | කතරගම | කතරගම | වල්ලිකන්දාරාමය |
| 14 | හම්බන්තොට | තිස්සමහාරාමය | තිස්සමහාරාමය | උද්දගන්ධර රජමහ විහාරය |
| 15 | මාතර | මාතර | වැලිගම | ශ්‍රී රතනතිලකාරාමය |
| 16 | මාතර | දික්වැල්ල | දික්වැල්ල | පබ්බතාරාමය |
| 17 | මාතර | ගන්දර | දෙවුන්දර | වනවාසල රජමහ විහාරය |
| 18 | මාතර | වැලිගම | වැලිගම | පියරතනාරාමය |
| 19 | මාතර | තිහගොඩ | නාරංගල | ශ්‍රී දේවප්‍රිය විහාරස්ථානය |
| 20 | මාතර | කඹුරුපිටිය | කඹුරුපිටිය | ශ්‍රී ප්‍රියදර්ශනාරාමය |
| 21 | මාතර | හක්මන | හක්මන | ශ්‍රී සාරිපුත්තාරාම විහාරය |
| 22 | මාතර | ඌරුබොක්ක | පස්ගොඩ | විජේසේකරාරාමය |
| 23 | මාතර | මාවරල | පස්ගොඩ | රොටුඹ බුදුගල රජමහ විහාරය |
| 24 | මාතර | අකුරැස්ස | අකුරැස්ස | ශ්‍රී ධම්මාලෝක විහාරය |
| 25 | මාතර | පිටබැද්දර | පිටබැද්දර | ශ්‍රී ධර්ම විජයාරාමය |
| 26 | මාතර | කනංකේ | වැලිපිටිය | පුෂ්පාරාමය |
| 27 | මාතර | දෙණියාය | කොටපොල | ඉසිපතනාරාමය |
| 28 | මාතර | මොරවක | පිටබැද්දර | ගල්ලෙන විහාරය |
| 29 | ගාල්ල (ඇල්පිටිය) | ඇල්පිටිය | ඇල්පිටිය | දම්සර සෙනසුන විහාරය |
| 30 | ගාල්ල (ඇල්පිටිය) | පිටිගල | ඇල්පිටිය | ශ්‍රී බෝධි නිග්‍රෝධාරාමය |
| 31 | ගාල්ල (ඇල්පිටිය) | කරන්දෙණිය | කරන්දෙණිය | ශ්‍රී අභයතිස්සාරාමය |
| 32 | ගාල්ල (ඇල්පිටිය) | ඌරගස්මන්හංදිය | කරන්දෙණිය | බැද්දේහේන විහාරස්ථානය |
| 33 | ගාල්ල (ඇල්පිටිය) | බද්දේගම | බද්දේගම | ශ්‍රී සුදර්ශනාරාම විහාරය |
| 34 | ගාල්ල (ඇල්පිටිය) | තෙලිකඩ | හික්කඩුව | ගලතොට විහාරය |
| 35 | ගාල්ල (ඇල්පිටිය) | මීටියාගොඩ | අම්බලන්ගොඩ | නාගරුක්ඛාරාමය |
| 36 | ගාල්ල (ඇල්පිටිය) | අම්බලන්ගොඩ | අම්බලන්ගොඩ | ශ්‍රී ගංගාරාම පුරාණ විහාරස්ථානය |
| 37 | ගාල්ල (ඇල්පිටිය) | කොස්ගොඩ | කොස්ගොඩ | බොරලුකැටිය ශ්‍රී සුමනාරාමය |
| 38 | ගාල්ල (ඇල්පිටිය) | බෙන්තොට | බෙන්තොට | ශ්‍රී නන්දනාරාම විහාරය |
| 39 | ගාල්ල (ඇල්පිටිය) | අහුංගල්ල | බලපිටිය | ශ්‍රී සුදර්ශනාරාම විහාරය |
| 40 | ගාල්ල (ගාල්ල) | ගාල්ල | ගාල්ල | තෙන්කල්ලගොඩ ශ්‍රී සුභද්‍රාරාමය |
| 41 | ගාල්ල (ගාල්ල) | රත්ගම | රත්ගම | ශ්‍රී විජයාරාම විහාරස්ථානය |
| 42 | ගාල්ල (ගාල්ල) | අක්මීමන | අක්මීමන | ශ්‍රී බෝධිමළු විහාරය |
| 43 | ගාල්ල (ගාල්ල) | පොද්දල | පොද්දල | ගස්දෙණිය ආරණ්‍ය සේනාසනය |
| 44 | ගාල්ල (ගාල්ල) | යක්කලමුල්ල | යක්කලමුල්ල | ශ්‍රී ධර්මෝදය පුරාණ විහාරය |
| 45 | ගාල්ල (ගාල්ල) | වඳුරඹ | බද්දේගම | අභිනවාරාමය |
| 46 | ගාල්ල (ගාල්ල) | හබරාදූව | හබරාදූව | සිරිවර්ධනාරාමය |
| 47 | ගාල්ල (ගාල්ල) | අහංගම | හබරාදූව | ශ්‍රී සුදර්ශනාරාමය |
| 48 | ගාල්ල (ගාල්ල) | ගාල්ල වරාය | ගාල්ල කඩවත්නගර | විජිතාරාමය |
| 49 | ගාල්ල (ගාල්ල) | උඩුගම | නාගොඩ | සිරි ප්‍රිදර්ශනාරාමය |
| 50 | ගාල්ල (ගාල්ල) | නාගොඩ | නාගොඩ | මාමනදොල ශ්‍රී විජේසිංහාරාමය |
| 51 | ගාල්ල (ගාල්ල) | හිනිදුම | තවලම | බෝසෙවණ විහාරය |

| | | | | |
|---|---|---|---|---|
| 52 | ගාල්ල (ගාල්ල) | නෙළුව | නෙළුව | ශ්‍රී සුමේධාරාම විහාරස්ථානය |
| 53 | රත්නපුර | රත්නපුර | දොඩම්පෙ | විවේකාරාමය |
| 54 | රත්නපුර | වේවැල්වත්ත | පැල්මඩුල්ල | ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය |
| 55 | රත්නපුර | ඇහැලියගොඩ | ඇහැලියගොඩ | ගිරවංශාරාම විහාරස්ථානය |
| 56 | රත්නපුර | කුරුවිට | ඇහැලියගොඩ | ශ්‍රී අභිනවාරාම විහාරය |
| 57 | රත්නපුර | බලංගොඩ | බලංගොඩ | ශ්‍රී විසුද්ධාරාම පුරාණ විහාරය |
| 58 | රත්නපුර | ඕපනායක | ඔපනායක | ශ්‍රී සුදර්ශනාරාමය |
| 59 | රත්නපුර | කල්තොට | බලංගොඩ | ලංකා පබ්බත විහාරය |
| 60 | රත්නපුර | වැලිගෙපොල | වැලිගෙපොල | හඳගිරිය විහාරස්ථානය |
| 61 | රත්නපුර | කහවත්ත | පැල්මඩුල්ල | ශ්‍රී සුගුණාරාම සීලාශ්‍රමය |
| 62 | රත්නපුර | කහවත්ත | පැල්මඩුල්ල | මීගහලොඩ පුරාණ මහ විහාරය |
| 63 | රත්නපුර | රක්වාන | ගොඩකවෙල | ශ්‍රී මෙත්තාරාම නිශ්ශංක විහාරය |
| 64 | රත්නපුර | ගොඩකවෙල | වැලිගෙපොල | ශ්‍රී නිග්‍රෝධාරාම විහාරය |
| 65 | රත්නපුර | උඩවලව | ඇඹිලිපිටිය | ශ්‍රී පන්සල් කන්ද විහාරස්ථානය |
| 66 | රත්නපුර | කිරිඇල්ල | කිරිඇල්ල | ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය |
| 67 | රත්නපුර | අයගම | අයගම | ශ්‍රී විජයාරාම විහාරස්ථානය |
| 68 | රත්නපුර | කලවාන | කලවාන | ශ්‍රී කුසුමරුක්කාරාමය |
| 69 | රත්නපුර | නිවිතිගල | නිවිතිගල | ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය |
| 70 | රත්නපුර | ඇඹිලිපිටිය | ඇඹිලිපිටිය | කාවන්තිස්පුර විහාරය |
| 71 | රත්නපුර | කුට්ටිගල | ඇඹිලිපිටිය | තෙරුන්කටුව රජමහ විහාරය |
| 72 | රත්නපුර | පනාමුර | ඇඹිලිපිටිය | ඉසිපතනාරාම රජමහ විහාරය |
| 73 | රත්නපුර | කොළොන්න | කොළොන්න | ශ්‍රී විෂුද්ධාරාම විහාරය |

## වගු අංක 08

2014 වර්ෂයේ දී පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ විහාරස්ථාන ආධාර ලබා දීම.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ආවරණය වූ විහාරස්ථාන සංඛ්‍යාව | සහභාගී වූ පිරිස |
|---|---|---|---|---|
| 01 | රත්නපුරය | 01 | 60 | 329 |
| 02 | ගාල්ල | 01 | 60 | 231 |
| 03 | මාතර | 01 | 52 | 245 |
| 04 | හම්බන්තොට | 01 | 60 | 245 |
| එකතුව | | **04** | **232** | **1050** |

## වගු අංක 09

2014 වර්ෂයේ දී මතට තිත වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන / ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | වෙන් වූ ප්‍රතිපාදන (රු.) | වැය වූ ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|---|
| 01 | රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම. | 10 | 1,000,000.00 | 397,790.00 |
| 02 | අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම් (ගුරුවරුන් හා සිසුන්) | 11 | 1,217,500.00 | 404,419.00 |
| 03 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් (සරසවි සිසුන් හා ආචාර්යවරුන්) | 02 | 336,250.00 | 138,000.00 |
| 04 | ආරක්ෂක අංශ සමඟ මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් (පොලිස්, සිවිල් ආරක්ෂක හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්) | 07 | 331,250.00 | 172,900.00 |
| 05 | විශේෂිත දින ක්‍රියාකාරකම් (වාර්ෂික පෙරහැර, වෙසක් උත්සවය, පොසොන් උත්සවය, ඇසළ උත්සවය හා වෙනත්) | 06 | 100,000.00 | 97,500.00 |
| 06 | දහම් පාසල් ආශ්‍රිත මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් | 49 | 2,540,000.00 | 2,137,351.00 |
| 07 | නගර දැනුවත් කිරීම හා නීතිය ක්‍රියාවට නැංවීම. | 10 | 76,500.00 | 25,000.00 |
| 08 | මත්ද්‍රව්‍ය නිවාරණ විශේෂිත ක්‍රියාකාරකම් (ධර්ම දේශනා වැනි විවිධ ඉල්ලීම්) | 08 | 200,000.00 | 100,000.00 |
| 09 | බන්ධනාගාර රැඳවියන් සඳහා වැඩසටහන් | 01 | 200,000.00 | 35,500.00 |
| 10 | අධ්‍යාත්මික රසවින්දන වැඩසටහන් | 04 | 220,000.00 | 30,000.00 |
| **එකතුව** | | **108** | **6,221,500.00** | **3,538,460.00** |

### වගු අංක 10

2014.12.31 දිනට සිල්මාතාවන්ගේ කුසලතා ප්‍රවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අනු අංකය | කාරණය | භෞතික ප්‍රගතිය (වැඩසටහන් ප්‍රමාණය) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| 01 | සිල්මාතා වැඩසටහන | 01 | 0.134 |
| 02 | පිරිවෙන් අධ්‍යාපනය නැංවීම සඳහා | 05 | 1.6 |
| **එකතුව** | | **06** | **1.734** |

### වගු අංක 11

2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් අඩුපහසුකම් සහිත දහම් පාසල් සංවර්ධනය කිරීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | දහම් පාසල් ගණන | ලබා දුන් ආධාර මුදල (රු.) |
|---|---|---|---|
| 01 | කොළඹ | 07 | 1,000,000.00 |
| 02 | කළුතර | 07 | 1,050,000.00 |
| 03 | මහනුවර | 16 | 1,400,000.00 |
| 04 | ගම්පහ | 10 | 1,500,000.00 |
| 05 | රත්නපුර | 05 | 650,000.00 |
| 06 | ගාල්ල | 03 | 450,000.00 |
| 07 | යාපනය | 01 | 50,000.00 |
| 08 | පොළොන්නරුව | 01 | 150,000.00 |
| 09 | අනුරාධපුරය | 01 | 150,000.00 |
| 10 | කුරුණෑගල | 227 | 26,150,000.00 |
| 11 | පුත්තලම | 299 | 32,050,000.00 |
| 12 | කෑගල්ල | 297 | 32,550,000.00 |
| **එකතුව** | | **874** | **97,150,000.00** |

## වගු අංක 12

විහාරස්ථාන බොදු දිනපොත් මුද්‍රණය

| අනු අංකය | දිනපොත් වර්ගය | වියදම (රු.මි.) | දිනපොත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විහාරස්ථාන දිනපොත | 5.75 | 26,500 |
| 02 | ඇමතුම් දිනපොත | 1.05 | 12,500 |
| **එකතුව** | | **6.80** | **39,000** |

## වගු අංක 13

2014 වර්ෂයේ දී දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ආධාර ලබා දීම.

| අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථාන සංඛ්‍යාව | ලබා දුන් ආධාර මුදල (රු.මි.) |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | 26 | 07 |
| 02 | කුරුණෑගල | 108 | 14 |
| 03 | පුත්තලම | 16 | 02 |
| 04 | කෑගල්ල | 101 | 12 |
| **එකතුව** | | **251** | **35** |